# සන්නිවේදනය හා අපරාධ

## (සන්නිවේදන මාධ්‍ය අපරාධ කෙරෙහි බලපෑම)

**සමාජීය විද්‍යාපති උපාධි (ජනසන්නිවේදන) පාඨමාලාව සඳහා**

**ඉදිරිපත් කරන ස්වාධීන නිබන්ධනය 2005.**


| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 1192 |
| වර්ග අංකය: | |


**විභාග අංකය** FGS/M/M.S.Sc/2005/07


**පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය**

**කැලණිය විශ්වවිද්‍යාලය**

**දළුගම, කැලණිය.**

# සන්නිවේදනය හා අපරාධ (සන්නිවේදන මාධ්‍ය අපරාධ කෙරෙහි බලපෑම)

එච්. පී. කොඩිකාර


## නිබන්ධන සාරාංශය

වර්තමානයේ අපරාධ ඉහළ යමින් පැවතීම නිසා සන්නිවේදනය හා අපරාධ පිළිබඳ පර්යේෂණය කිරීම කාලෝචිතය. අපරාධ හා සන්නිවේදනය විෂයක්ෂේත්‍ර 2ක් ඔස්සේ අවියෝජනීයව බැඳී ඓතිහාසිකව පැවත එයි. විද්වතුන්ගේ න්‍යායික හා සංකල්පීය නිර්වචන අනුව එය තහවුරු වේ. සන්නිවේදන මාධ්‍ය අපරාධ කෙරෙහි කෙසේ බලපාන්නේ ද? අවධානය යොමුකර, ප්‍රබල සන්නිවේදන මාධ්‍යයක් වන රූපවාහිනී මාධ්‍යයේ බලපෑම සෙවීම පර්යේෂණ ගැටලුව වේ.

ද්විතියික හා ප්‍රාථමික මූලාශ්‍ර ඇසුරෙන් දත්ත රැස්කර, ප්‍රශ්නාවලි ක්‍රමය භාවිතයෙන් සමීක්ෂණය සිදුකර ඇත. ප්‍රදේශයේ සමාජ සංස්කෘතික ස්වභාවයන් පිළිබඳ විශේෂ අවධානය යොමුකර ලබාගත් දත්ත විද්‍යාත්මකව හා සංඛ්‍යාත්මකව විශ්ලේෂණය කර ඇත. මාධ්‍ය ප්‍රබලතා හා දුබලතා අනුව මාධ්‍යයන් අපරාධ කෙරෙහි ඇතිකරන පෙළඹවීම මාධ්‍ය ව්‍යුහය අනුව දක්වා ඇත, වෙළඳ අරමුණු මුල්කර ජනප්‍රිය සංස්කෘතික අංග බටහිර ආකෘතීන් සමඟ සම්බන්ධ කර වර්තමාන මාධ්‍ය ව්‍යුහය සකස් කර ඇත. ප්‍රබල මාධ්‍යයක් වන රූපවාහිනිය ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන්ට පෙළඹවීමක් ඇති කරමින් අපරාධ ඇති කිරීමට දායක වේ ද? යන්න එහි මාධ්‍ය ව්‍යුහය විශ්ලේෂණයෙන් පැහැදිලි වේ.

ප්‍රචණ්ඩත්වය හා අපරාධ සඳහා ප්‍රමුඛ හේතුව මාධ්‍ය සන්දේශ නොවන බවත්, එයට සමාජ, සංස්කෘතික සාධක බලපාන බවත් දත්ත විශ්ලේෂණයෙන් පැහැදිලි වේ. මෙලෙස ඇතිවන සමාජ ගැටලුවට පිළියම් ලෙස රාජ්‍ය හා පෞද්ගලික අංශ ඔස්සේ විවිධ ක්‍රියාමාර්ග ගත හැක. එමෙන්ම මාධ්‍ය සන්දේශ පිළිබඳව ක්‍රියා කිරීමේ දී දෙමව්පියන්, අධ්‍යාපනඥයින්, සමාජ විද්වතුන් ආගමික නායකයින් හා තරුණ පරපුර වෙත පැවරී ඇති වගකීම නිසි අයුරින් ක්‍රියාවට නැංවිය යුතුය.


---

මුඛ්‍ය පද: අපරාධ, ප්‍රචණ්ඩත්වය, සන්නිවේදනය, රූපවාහිනිය, මාධ්‍ය ව්‍යුහය

## Impact of mass media on crime

By

H. P. Kodikara

## ABSTRACT

In the present day society crimes are on the increase. Under such a background subjecting to discussion the factors prone to crimes are a timely topic, although crimes and media communication are too different subjects and feels, they have hither to descend down, inseparably through out the history. Theoretical and conceptual elucidations made by the scholars of various disciplines confirm the above connections. In fact of the media communication or crimes is quit a wide field hence, with a view to the influence of mass communication on crimes, to verify how television the most effective media communication is contributory on the influence of crimes is the object of the investigation.

Data was made available from primary and secondary sources for the success of the research in order to achieve the objectives. The research, investigations were made by the use of methodology of questioning. The data assembled from social, economical, political, cultural and religious backgrounds were subjected through scientific and statistical analysis. Presently every communicative media is replete with commercialized media structures. On analyzing the content of the media modules of most effective media television, whether it is responsible for crimes by way of media violence may be shown. Analysis of data obtained show that the media documentaries being not the only cause for crime while social and cultural factors in the background are among them. When remedies are sought for such social problems, both the state and the private sector can take various positive measures. On receiving media documentaries broadcasting, it is the responsibility of the parent educationalist, religious dignitaries, sociologists to be considerate of the younger generation and the youth.